**ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 23 දින දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 706.51 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 682.01 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 24.50 ක් හෙවත් සියයට 3.47 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- |
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 337.21 | 332.79 | 4.42 | 1.31 |
| මූලධන | 369.30 | 349.22 | 20.08 | 5.44 |
| **එකතුව** | **706.51** | **682.01** | **24.50** | **3.47** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශයක් සහ කාර්යාල 02 ක් විසින් එකතුව රු.මිලියන 17.25 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 17.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 0.11 ක් හෙවත් සියයට 0.63 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ කාර්යාලය | 2015 දෙසැම්බර් 31 දිනට | | |
| --- | --- | --- | --- |
| | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 1.55 | 1.54 | 0.01 |
| ජනාධිපති කාර්යාලය | 10.14 | 10.07 | 0.07 |
| අගමැති කාර්යාලය | 5.56 | 5.53 | 0.03 |
| **එකතුව** | **17.25** | **17.14** | **0.11** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ අංක 20.03.02.19 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 500 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 547.8 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 109.6 ක් වී තිබුණි.

**2.3 අත්තිකාරම් ගිණුම**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 32201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 22.64 | 21.46 | 12.64 | 17.08 | 80.00 | 58.53 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ ගිණුම් අංක 7002/0000/00/0405/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 0.11 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 177.51 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0087/000 | 4.23 |
| 6000/0000/00/0013/0057/000 | 5.57 |
| 6000/0000/00/0006/0070/000 | 145.40 |
| 6000/0000/00/0016/0039/000 | 22.07 |
| 6000/0000/00/0018/0049/000 | 0.24 |
| **එකතුව** | **177.51** |

**2.6 විගණන නිරීක්ෂණය**

උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

## 3.2 විසර්ජන ගිණුම

### අය වැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 3.00 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 07 ක සිට සියයට 23 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 5.01 ක් වූ තැන්පතු 38 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 32201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.262,307 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් පහත සඳහන් ක්‍රියාකාරකම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(අ) 2015 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ නිල නිවාස 02 ක් අලුත්වැඩියාව හා ගිම්හාන කුටි 02 ක් ඉදිකිරීම.

(ආ) 2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වූ ගම්පහ උද්භිද උද්‍යානයේ වාහන අංගනයක් අලුත්වැඩියා කිරීම.

**3.5.2 වාර්ෂික කාර්යසාධන වාර්තා**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මෝටර් වාහනයක් වසර 03 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. එම වාහනය අපහරණය කිරිමට 2016 ජුනි 14 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් ඒකක 25 කින් ඒකක 07 ක එම වාර්තා 2016 ජුනි 23 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 880, 881 හා 882 | මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය දී ඇති නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සෑම මාස 06 කට වරක්ම සිදුකළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. |

**3.8 කාර්යසාධනය**

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

ඖෂධ පැළ හා ශාක නඩත්තුව පිළිබඳව පුහුණු මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යෑමේ අරමුණින් මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය 2008 වර්ෂයේදී පිහිටුවා තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් එය ක්‍රියාකාරීත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන පටිපාටිය මගින් හැකිතාක් දුරට මහජන තරගයකට ඉඩ ප්‍රස්ථාව ලබාදීම තුළින් උචිත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු වුවත්, අක්කර 08 ක වපසරියකින් යුත් සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් තේ සහිත ඉඩම බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පෙර බදු මුදලට සියයට 15 ක ප්‍රමාණයකින් ලංසුව වැඩි කර පැරණි බදුකරුටම එම ඉඩම ලබාදී තිබුණි.

## 3.10 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ 2014 වර්ෂයේ රු.468,428 ක් වැයකර ඇන්තූරියම් පැළ 2,493 ක් උපරෝපණය කර තිබූ නමුත් වර්ධිත පැළ වශයෙන් කිසිදු පැළයක් විද්‍යාගාරයෙන් පැළ තවානට නිකුත්කර නොතිබුණි.

(ආ) නරඹන්නන්ගේ ආශ්වාදය සඳහා දැනට පේරාදෙණිය, හක්ගල, ගම්පහ, මිරිජ්ජවිල හා අවිස්සාවේල්ල යන උද්භිද උද්‍යාන 05 ක් විවෘතව තිබෙන අතර, ඉන් ගම්පහ හා මිරිජ්ජවිල යන උද්‍යාන 02 ක් නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ප්‍රමාණය ඉතා පහළ මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යෑම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වුවද ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකිරීම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 15 | 18 | - |
| (ii) | තෘතියික මට්ටම | 09 | 05 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 186 | 113 | 73 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 521 | 515 | 40 | 34 |
| (v) | වෙනත් (සමෘද්ධි අධිකාරියේ සිට අනුයුක්ත කර ඇති) | - | 10 | - | 10 |
| | **එකතුව** | **749** | **658** | **135** | **44** |